ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

## අදියර II විභාගය - 2026 ජනවාරි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය
(Advanced Financial Accounting & Costing)

---

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයට වෙන් කර ඇති ලකුණු විසිපහක් වන අතර, එය බහුවරණ ප්‍රශ්න පහක්, න්‍යායාත්මක ප්‍රශ්න තුනක් සහ ගණනය කිරීම් පදනම් කරගත් ප්‍රශ්න දෙකක් ඇතුළුව උප ප්‍රශ්න 10 කින් සමන්විත විය. ගිණුම්කරණය සහ පිරිවැයකරණ විෂය ක්ෂේත්‍ර පිළිබඳ මූලික දැනුම ආවරණය කරමින් දැනුම පරීක්ෂා කර ඇත.

උත්තර පත්‍ර ඇගයීමේ ක්‍රියාවලියේදී පහත සඳහන් පොදු දුර්වලතා සහ වැරදි නිරීක්ෂණය විය.

**1.1** මෙම ප්‍රශ්නය මගින් නිශ්චිත වසර අවසානයේ ක්ෂයවීම පිළිබඳ දැනුම සහ ධාරණ අගය තීරණය කිරීම පරීක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි උත්තර ලබා දුන් අතර, සරල මාර්ග ක්ෂයවීමේ ක්‍රමය පිළිබඳ පැහැදිලි අවබෝධයක් පෙන්නුම් කළහ. කෙසේවෙතත්, අයදුම්කරුවන් කිහිප දෙනෙකුට නිවැරදි ධාරණ අගය ගණනය කිරීමට නොහැකි වූ අතර, ක්ෂයවීම සහ සුන්බුන් අගය සැලකීම පිළිබඳ සංකල්පීය පැහැදිලිකමක් නොමැති බව පෙන්නුම් කරයි.

**1.2** වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු බණී 10 - සිදුවීම් පිළිබඳ අයදුම්කරුවන්ගේ අවබෝධය මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂා කරන ලදී. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් නිවැරදි පිළිතුරු සපයා ඇති අතර ගැලපිය යුතු සිදුවීම් හා ගැලපීම් නොකළ යුතු සිදුවීම් පිළිබඳ අවබෝධයක් නොමැතිකම හේතුවෙන් කිහිප දෙනෙකුට පිළිතුරු දීමට නොහැකි විය.

**1.3** මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ට APIT අඩු කිරීම, EPF සහ ETF ගණනය කර ශුද්ධ වැටුප සොයා ගැනීමට අවශ්‍ය විය. අයදුම්කරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් නිවැරදි පිළිතුරු සපයා තිබූ අතර කිහිප දෙනෙකුට ප්‍රශ්නයට පිළිතුරු දීමට නොහැකි විය.

**1.4** 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පෙර ගෙවීම්, උපචිත වියදම් සහ වර්ෂයට අදාල වියදම පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා ඇති අතර සමහර අයදුම්කරුවන් වැරදි ගණනය කිරීම් හේතුවෙන් වෙන්කර තිබූ ලකුණු ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි.

**1.5** කිසියම් නිෂ්පාදනයක නැවත ඇණවුම් මට්ටම (Re-Order Level) පිළිබඳව ප්‍රශ්නය පරීක්ෂා කරන ලදී. මේ සඳහා ද්‍රව්‍ය පිරිවැයකරණයේ මූලික පිරිවැය සූත්‍රයකට සංඛ්‍යා ආදේශ කිරීම අවශ්‍ය වේ. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා ඇති අතර සමහර අයදුම්කරුවන් වෙන් කළ ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට අපොහොසත් වී ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශනවල සංරචක දෙකක් (2) හඳුනා දක්වන ලෙස සඳහා මෙම ප්‍රශ්නය අසන ලද නමුත්, බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නය නිසි ලෙස තේරුම් ගෙන නොමැති අතර මූල්‍ය ප්‍රකාශනවල ඇති මූලිකාංග සමඟ පිළිතුරු ලෙස සපයා ඇත. අයදුම්කරුවන් කිහිප දෙනෙකු පමණක් නිවැරදිව පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

1.7 කාල අනුපාත ගෙවුම් ක්‍රමයක වාසි පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂා කරන ලදී. අවශ්‍ය මට්ටමින් පිළිතුරු සපයා ඇත්තේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් පමණි. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා ලකුණු ලබා නොගත් අතර, එයින් පෙන්නුම් කරන්නේ ස්ව-අධ්‍යයන පොත් පිළිබඳ අවධානයක් නොමැති බව පෙන්නුම් කරයි.

1.8 1890 හවුල් ආඥා පනතේ 24 වන වගන්තිය පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණද, සමහර අයදුම්කරුවන් 24 වන වගන්තිය පිළිබඳ දැනුම නොමැතිකම නිසා පිළිතුරු සැපයීමට අපොහොසත් වී තිබුණි.

1.9 ව්‍යාපාරය විසින් ගෙවිය යුතු වැට් බද්ද ගණනය කිරීම අවශ්‍ය වූ අතර බොහොමයක් අයදුම්කරුවන් එය නිවැරදිව ගණනය කර තිබුණි. කෙසේවෙතත්, අවම අයදුම්කරුවන් ප්‍රමාණයක් නිවැරදි පිළිතුර ලබා දීමට අසමත්ව තිබුණි.

1.10 නිශ්චිත කාර්යයක් සඳහා අය කළ යුතු මිල ගණනය කරන ලෙස ඉල්ලා ඇත. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි මිල සාර්ථකව ගණනය කළහ. කෙසේවෙතත්, සමහර අයදුම්කරුවන් කාර්ය පිරිවැයකරණය සහ මිලකරණය පිළිබඳ සංකල්ප පිළිබඳ ඔවුන්ගේ අවබෝධයේ මඳ බවක් පිළිබිඹු කරමින් නිවැරදි ලාභ ආන්තිකය ගණනය කිරීමට අපොහොසත් වී ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## <u>B කොටස</u>

### ප්‍රශ්න අංක 02

වර්ෂය සඳහා ශුද්ධ ලාභය සහ වර්ෂය අවසානයේ ප්‍රාග්ධන (ස්කන්ධය) ශේෂය ගණනය කිරීම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී. සමහර අයදුම්කරුවන් ස්කන්ධ ශේෂය නිවැරදිව ගණනය කර නොතිබුණි.

තවද, සමහර අයදුම්කරුවන්ගේ පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය:

(1) මුදල් පොත පිළියෙල කිරීම සඳහා සැලකිය යුතු කාලයක් වැය කර ඇති බව නිරීක්ෂණය විය.

(2) කලින් ගෙවන ලද කුලිය නොසලකා හැර තිබුණි.

(3) සමහර අයදුම්කරුවන් විසින් වෙළඳ ණයගැතියන්ගෙන් එකතු කරන ලද මුළු මුදලින් සේවකයින්ට ගෙවන 10% ක දිරි දීමනාව ගිණුම්වලට සටහන් කර නොමැත.

(4) බොහොමයක් අයදුම්කරුවන් ශුද්ධ ලාභය සහ ප්‍රාග්ධන ශේෂය ගණනය කිරීම සඳහා ගණනය කිරීමට ඉල්ලා සිටි ප්‍රාග්ධන/ස්කන්ධ ක්‍රමය අනුගමනය කර නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය මගින් හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් සහ ප්‍රාග්ධන ගිණුම් පිළියෙල කරන්නේ කෙසේද යන්න පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරන ලදී. තවද, මෙම ප්‍රශ්නය මගින් හවුල්කරුවෙකු ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමේදී සිදුකරන ගැලපීම් පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා හොඳින් උත්තර සපයා තිබුණි.

නමුත් පහත සඳහන් හේතූන් මත අයදුම්කරුවන් ඉතා ස්වල්පයක් හොඳින් උත්තර සපයා නොතිබුණිඃ

(1) කීර්තිනාම ගැලපීම නිසි ලෙස සිදු කර නොතිබුණි; ලබා දී ඇති උපදෙස් සැලකිල්ලට නොගෙන ජංගම ගිණුම්වලට ගැලපුම් සිදුකර තිබුණි.

(2) ජංගම ගිණුම්වලට අදාළ සමහර සටහන් ප්‍රාග්ධන ගිණුම්වලට ගැලපුම් කර තිබුණි.

(3) ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණය කිරීම සඳහා නිසි ගිණුම්කරණ ගැලපුම සමහර අයදුම්කරුවන් විසින් සිදු කර නොමැති අතර, ප්‍රත්‍යාගණන ලාභය හවුල්කරුගේ ප්‍රාග්ධන ගිණුම්වල ගිණුම්ගත කර නොමැති බව දක්නට ලදී.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 04

ලාභ නොලබන සංවිධානයක් සඳහා සාමාජිකයින්ගේ දායකත්ව ගිණුම සහ ආදායම් සහ වියදම් ගිණුම පිළියෙල කිරීම මෙම ප්‍රශ්නයෙන් අසන ලදී.

නිරීක්ෂණය වූ පොදු වැරදි පහත පරිදි වියඃ

(1) සමහර අයදුම්කරුවන් විසින් ආදායම් හා වියදම් ගිණුම් නිවැරදිව පිළියෙල කර නොතිබුණි.

(2) සාමාජිකයින්ගේ දායකත්ව ගිණුමට අදාළ හර සහ බැර ඇතුළත් කිරීම් අයදුම්කරුවන් කිහිප දෙනෙකු විසින් පටලවා ගෙන තිබුණි.

(3) නත්තල් සාදයට අදාළ ගනුදෙනු වෙන වෙනම හඳුනාගෙන නොමැති බවත්, සමහර අයදුම්කරුවන් සියලුම ගනුදෙනු ආදායම් හා වියදම් ගිණුමට ඇතුළත් කර ඇති බවත් දක්නට ලැබුණි.

(4) ආදායම් සහ වියදම් ගිණුම සඳහා පොදු ආකෘතිය අයදුම්කරුවන් කිහිප දෙනෙකු විසින් භාවිතා කර නොතිබුණි.

(5) ලැප්ටොප් පරිගණකයක් සඳහා වැය කළ මුදල (ප්‍රාග්ධන වියදම) ආදායම් හා වියදම් ගිණුමේ දක්වා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 05

(**a**) සහ (**b**) කොටස් දෙකකින් සමන්විත වේ.

**(a)** බරිත සාමාන්‍ය මිල ක්‍රමය භාවිතයෙන් **Y002 නිෂ්පාදනය** සඳහා තොග ලෙජරය පිළියෙල කරන ලෙස ඉල්ලා සිටි අතර බොහොමයක් අයදුම්කරුවන් හොඳින් උත්තර සපයා ඇති අතර ඉතා සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවක් තොග ලෙජරය නිවැරදිව පිළියෙල කිරීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය කරන ලදී.

**(b)** මූල්‍ය ගිණුම් සහ පිරිවැය ගිණුම් අතර ලාභ සන්සන්දනය කිරීමේ ප්‍රකාශනය පිළියෙළ කිරීම සඳහා ප්‍රශ්නයක් අසන ලද අතර බොහොමයක් අයදුම්කරුවන් අවශ්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

## ප්‍රශ්න අංක 06

**(a)** ලබා දී ඇති දත්ත මත පදනම්ව, එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය පිරිවැය, සේවා දෙපාර්තමේන්තු සඳහා විභජනය කරන ආකාරය දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කිරීම අවශ්‍ය විය. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා හොඳින් උත්තර ලියා තිබුණි.

**(b)** ලබා දී ඇති දත්ත මත පදනම්ව ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) ගණනය කිරීම මෙම ප්‍රශ්නයෙන් අසන ලදී. ද්‍රව්‍ය පිරිවැය යටතේ පිරිවැය ගණනය කිරීමේදී EOQ ගණනය කිරීම ඉතා මූලික ප්‍රශ්නයකි. අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක විය.

තවද, ඉතා සුළු අයදුම්කරුවන් සංඛ්‍යාවක් EOQ නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් වී ඇති බවද දක්නට ලදී.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

# C කොටස

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය පෞද්ගලික සීමිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පරීක්ෂා කරන ලද අතර එය (**a**) සහ (**b**) කොටස් 2 කින් සමන්විත වේ. (**a**) **කොටස** විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම පරීක්ෂා කරන ලද අතර, (**b**) **කොටසින්** මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම පරීක්ෂා කරන ලදී.

බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කර තිබූ අතර සමහර අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත් වී තිබුණි.

පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය:

**(a) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම:**

(1) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා සාමාන්‍යයෙන් පිළිගත් ආකෘතිය අනුගමනය කර තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකි.

(2) සමහර අයදුම්කරුවන් විසින් බදු ගැලපීම නිවැරදිව සිදු කර නොතිබුණි.

(3) සමහර අයදුම්කරුවන් විසින් මෝටර් රථ ඉවත් කිරීම සඳහා ගිණුම් සටහන් නිසි ලෙස සිදු කර නොතිබූ බැවින්, මෝටර් රථ ඉවත් කිරීමෙන් ලද නිවැරදි ලාභය ගිණුම්ගත කර නොතිබුණි. තවද, මෝටර් රථ, කාර්යාල උපකරණ සඳහා ක්ෂයවීම් නිවැරදිව ගිණුම්ගත කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(4) සමහර අයදුම්කරුවන් විසින් වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා නිවැරදි දීමනාව ගිණුම්ගත කර නොතිබුණි.

(5) සමහර අයදුම්කරුවන් පෙර වැඩ අමුණා නොතිබූ බැවින්, පෙර වැඩ සටහන් සඳහා වෙන් කර තිබූ ලකුණු ප්‍රමාණය වැඩි කර ගැනීමට නොහැකි විය.

(6) සමහර අයදුම්කරුවන් විසින් කලින් ගෙවූ කාර්යාල කුලිය ගැලපුම් කර නොතිබුණි.

(7) 2025 මාර්තු 31 දිනට තොගයේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධිත අගය අතර වෙනස නිසි ලෙස සකස් කර නොතිබූ බව ඉතා සුළු අයදුම්කරුවන් පමණක් ගැලපුම් කර තිබුණි.

**(b) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම:**

(1) සමහර අයදුම්කරුවන් වෙළඳ ලැබිය යුතු මුදල් වලින් බොල් ණය සඳහා වන ප්‍රතිපාදනය අඩු කර නොතිබුණි.

(2) සමහර අයදුම්කරුවන් ජංගම සහ ජංගම නොවන වත්කම් සහ වගකීම් අතර වෙනස නොදැන සිටි බව දක්නට ලැබුණි.

(3) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා සාමාන්‍යයෙන් පිළිගත් ආකෘතිය භාවිතා කර නොතිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් පමණි.

(4) කාර්යාල උපකරණ සහ මෝටර් රථවල සමුච්චිත ක්ෂයවීම් සමහර අයදුම්කරුවන් විසින් නිවැරදිව ගිණුම්ගත කර නොතිබුණි.

(5) අයදුම්කරුවන් කිහිප දෙනෙකු විසින් ගෙවිය යුතු ආදායම් බදු ගිණුම්වල ගලපා නොතිබුණි.

(6) සමහර අයදුම්කරුවන් මෝටර් රථ අත්පත් කර ගැනීම සහ ඉවත් කිරීම පිළිබඳ 5 වන ගැලපුම කිරීමට උත්සාහ දරා නොමැති බව නිරීක්ෂණය විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.**

\- - -

**විභාගයේදී කාර්යසාධන මට්ටම වැඩිදියුණු කරගැනීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:**

(1) ස්ව-අධ්‍යයන පාඩම් මාලා හොඳින් අධ්‍යයනය කර ඒවායේ අන්තර්ගත කරුණු තේරුම්ගත යුතුය.

(2) කළ යුතු ක්‍රියා පද නිර්වචනයන් තේරුම් ගැනීම සහ ප්‍රශ්න පත්‍රය අවසානයේ දී ඇති කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව මත පදනම්ව ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පුහුණු විය යුතුය.

(3) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වල අන්තර්ගත කරුණු අධ්‍යයනය කර අවම වශයෙන් ප්‍රශ්න පත්‍ර 2-3 කටවත් පිළිතුරු සැපයීමට පුහුණු වී ප්‍රශ්න ඉදිරිපත් කරන ආකාරය අවබෝධ කර ගත යුතුය.

(4) විභාගයට පෙර නියමිත කාලය වෙන් කරගෙන පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සපයා පුහුණු වීම මගින් විභාගයේදී කාලය කළමණාකරණයට ඉවහල් වේ.

(5) විභාගයේදී කියවීමට හැකි ආකාරයෙන් අත් අකුරු පැහැදිලිව ලිවිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම ආරම්භ කිරීමට පෙර, ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

(7) ප්‍රශ්න හොඳින් තේරුම්ගෙන ගැලපෙන හා නිවැරදි පිළිතුරු සැපයීම සඳහා විභාගය අවස්ථාවේදී පැහැදිලි මනසක් පවත්වා ගත යුතුය.

(8) එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය අනුව පිළිතුරු සැපයීමට ගත කළ යුතු කාලය වෙන් කර ගත යුතු අතර එමගින් සියළු ප්‍රශ්න සඳහා කාර්යක්ෂමව පිළිතුරු සැපයීමට හැකිවනු ඇත.

(9) පිළිතුරු පොත් භාරදීමට පෙර, අවශ්‍ය කරන සියළු ප්‍රශ්න වලට පිළිතුරු ලියා තිබේද, නිසි පරිදි අංක යොදා තිබේද ආදිය දෙවරක් පරීක්ෂා කර බැලිය යුතුය.

- * * * -